# ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය - **2012**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

උසස් ගිණුම්කරණ පරිචයන්ට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වර්ෂය තුළ දේපල, පිරියත හා උපකරණ මිළදී ගැනීම් හා ඉවත් කිරීම් මූල්‍ය ප්‍රකාශනයේ වෙනවෙනම හෙළිදරව් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී මිළදීගත් එකතුව රු.4,250,078 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ආයතනය සතු පර්චස් 6.09ක ඉඩම් කොටසක් වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් පවරාගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් රු.21,703,500ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ලබා දී තිබුණද, එහි පොත් අගය ගිණුම්වලින් ඉවත් කර ආයතනයට සිදුවූ ලාභය හෝ පාඩුව හඳුනාගෙන නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව වියදම් අයිතම දෙකක් වෙනුවෙන් රු.1,074,564 ක් වැඩියෙන්ද, එක් වියදම් අයිතමයක් සඳහා රු. 100,000 ක් අඩුවෙන්ද, උපචිත වියදම් වෙන්කිරීම නිසා වර්ෂයේ අතිරික්තය රු.974,564 කින් අඩුවෙන් පෙන්නුම් කෙරුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අභ්‍යන්තර ගිණුම් ශේෂයන් නොපෙන්විය යුතු වුවත් ප්‍රධාන

කාර්යාලයේ ඇති ශාඛා සමඟ වූ ජංගම ගිණුමේ හා ශාඛාවල ඇති ප්‍රධාන කාර්යාලය සමඟ වූ ජංගම ගිණුමේ රු. 89,167,040 ක් වූ හර හා බැර ශේෂ එකිනෙක හිලව් කළයුතු වුවද, එම ශේෂ මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වත්කම් හා බැරකම් යටතේ දක්වා තිබුණි.

### 1.2.3 නොසැසඳුණු පාලන ගිණුම්

ශාඛා කාර්යාලවල සේවයේ නියුතු නිලධාරින්ගේ ආපදා ණය ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශන අතර වූ රු.637,446 ක වෙනස නිරවුල් කර නොතිබුණි.

### 1.2.4 ලැබිය යුතු ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින් සඳහා වෛද්‍ය සේවා සැපයීම් වෙනුවෙන් අයවිය යුතුව තිබුණු රු. 3,312,650 ක් 2013 ඔක්තෝබර් මාසය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2010 ජුනි 01 සිට 2011 මැයි 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා කුරුණෑගල ශාඛාව වෙනුවෙන් ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණත් එම කාල පරිච්ඡේදය අවසන් වීමට පෙර එනම් 2010 දෙසැම්බර් 31 දින සිට එම ශාඛාව වෙනත් ස්ථානයකට රැගෙන යාම හේතුවෙන්, රු.87,500ක් වූ ආරක්ෂක ඇප තැන්පතු 2013 ඔක්තෝබර් මාසය වන විටත් අයකර ගෙන නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත ගිණුම් විෂයයන් සඳහා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත්නොවිය.

| ගිණුම් විෂයයන් | ගිණුමේ ශේෂය<br>රු. | ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් | 69,176,686 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| (ආ) තොගය | 6,050,388 | තොග සමීක්ෂණ වාර්තා |
| (ඇ) ණයගැතියෝ | 4,030,546 | (i) ශේෂ සනාථ කිරීම් |
| | | (ii) කාල විශ්ලේෂණ |

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) XIV වන පරිච්ඡේදය 1.3 වගන්තිය | රාජකාරීවල යෙදවූ නිලධාරින් සඳහා සංයුක්ත දීමනාවට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී නවාතැන් සහ ආහාරපාන සඳහා පිළිවෙලින් රු.227,453ක් සහ රු.46,180ක් ආයතනය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. |
| (ii) XV වැනි පරිච්ඡේදයේ 10 වන වගන්තිය හා 2006 පෙබරවාරි 10 දිනැති අංක සිඑස්ජ්/01/01/2006 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ පළමුවන ඡේදය | ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වෛද්‍යවරයෙකු අග්‍රාමාත්‍යතුමාගේ අවසරයක් ලබා නොගෙන විදේශගත වී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.396(ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ඉක්ම වූ එකතුව රු. 80,832ක් වටිනා චෙක්පත් 07ක් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ.757(2)(ආ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මු.රෙ.762 | ආයතනයේ ප්‍රධානතම තොග අවශ්‍යතාවයන් වන මුද්‍රිත වෛද්‍ය සහතිකපත් හා රසායනාගාර තොග සම්බන්ධයෙන් තොග මට්ටම් නිශ්චය කිරිමට ආයතනය විසින් අවධානය යොමු කර |

නොතිබුණි.

(ඈ) 1971 අංක 38 දරන මුදල් පනත

| | |
|---|---|
| (i) මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත්වල පිළිවෙලින් රු.27,281,106ක් සහ රු.190,645,275ක මුදලක් ආයෝජනය කර තිබුණත් ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ii) මුදල් පනතේ 14(3) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය | 2011 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2013 ඔක්තෝබර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 31/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | එක් නිලධාරියෙකුට ගෙවිය යුතු උපරිම උත්සව අත්තිකාරම් මුදල රු.5,000ක් වුවද රු.25,000 බැගින් ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,960,000 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ii) 2011 දෙසැම්බර් 12 දිනැති අංක 27/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | එක් නිලධාරියෙකුට ගෙවිය යුතු උපරිම විශේෂ අත්තිකාරම් මුදල රු.2,500ක් වුවද, රු.25,000 බැගින් ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.2,165,000 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. |

(ඉ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞ්/12 දරන චක්‍රලේඛයේ 8.3.3 (සී) වගන්තිය හා 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ප්‍රසාද දීමනා හා දිරි දීමනා යන දෙකෙන් එකක් පමණක් ගෙවීම් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රසාද දීමනා ලෙස රු.935,000ක් හා දිරි දීමනා ලෙස රු.467,500 ක් ගෙවා තිබුණි. මෙම දිරි දීමනා සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ii) 2008 ජූලි 28 දිනැති අංක පීඊඞ්/50 දරන චක්‍රලේඛයේ 3 ඡේදය හා 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i) සභාපතිවරයෙකුට හිමි මාසික ඉන්ධන ප්‍රමාණය ලීටර් 140ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ මාස 06කට අදාළව සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 603.7ක් ලබා ගෙන තිබුණි.<br>(ii) මාසික ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට හිමිකමක් නොමැති III වන පන්තියේ ගණකාධිකාරිවරයකුට මාසිකව රු.12,500 බැගින් රු.150,000 ක ඉන්ධන දීමනාවක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ ඌනතාවය රු.13,979,214ක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,668,769ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.59,647,983ක් වූ පිරිහීම සඳහා වෛද්‍ය සේවා ආදායම රු.41,610,027 ක අඩුවීම හා වැටුප් හා දීමනා රු.15,491,569 ක වැඩිවීම විශේෂයෙන්ම බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

ගණකාධිකාරිවරිය විසින් 2010 ඔක්තෝබර් 10 දිනැති අංක 1/2010 දරන වෙළඳ තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය යටතේ තීරු බදු රහිත මෝටර් රථ ආනයනය කිරීමේ බලපත්‍රයක් ඉල්ලුම් කර තිබූ අතර, එය ලබා ගැනීමට ඇයගේ සේවා කාලය ප්‍රමාණවත් නොවූයෙන් එය ලබාගත හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇයගේ පත්වීම වසර දෙකකින් පෙරදාතම් කර තිබුණි.

3.2 සේවක මණ්ඩල පරිපාලන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය සහ 2012 ඔක්තෝබර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේ දී නිලධාරීන් 86ක අතිරික්තයක් සහ නිලධාරීන් 24ක ඌනතාවයක් විය.

(ආ) ප්‍රවාහන වෛද්‍ය ආයතනය සඳහා 2010 වර්ෂයේ දී යෝජනා කර තිබූ නව කාර්ය මණ්ඩලය හා සංවිධාන සටහන 2012 නොවැම්බර් 20 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණ ද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඩී) වගන්තිය ප්‍රකාරව සංවිධාන සටහන සහ අනුමත කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව ආයතනය වෙනුවෙන් සකස් කර ඉදිරිපත් කර තිබූ බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටිය සඳහා මහා භාණ්ඩාගාරයේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ පරිපාලන උපදේශක තනතුරක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු, 2011 දෙසැම්බර් 01 දින සිට පත්කර සමාලෝචිත වර්ෂය තුළදී රු. 349,650ක දීමනාවක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

4.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.3.1 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15කට පෙර සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කළයුතු වුවද, 2011 - 2013 කාල පරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2011 නොවැම්බර් 29 දිනදීය.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2 මාර්ගෝපදේශය ප්‍රකාර 2012 වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන හා තථ්‍ය ශේෂයන් සංසන්දනය කිරීමේ දී සියයට 38 සිට සියයට 93ක පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් එය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධ අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) සේවක ණය

(ඇ) ණයගැතියෝ

(ඈ) තොග පාලනය

(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඊ) අයවැය පාලනය